**සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව 2018**

---

## 1.1 අහිතකර මතය

සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ ("බැංකුව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා අහිතකර මතයක් ප්‍රකාශ කර ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලටට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 මූල්‍ය ප්‍රකාශන

#### 1.5.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ, 2018 ජනවාරි 01 දින හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා අදාල වේ. කෙසේ වෙතත්, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණ බැවින් එමඟින් මූල්‍ය වාර්තාවලට වූ බලපෑම අගය කළ නොහැකි විය. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කර ගත් පසුව නිරීක්ෂණය නිවැරදි කර ඇත. | යෝග්‍ය ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

#### 1.5.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 3.7.1 අනුව නිශ්චිත ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් තක්සේරුකරුවකුගේ ආයුගණක සේවාව අවුරුදු 3කට වරක් ලබා ගතයුතුවේ. කෙසේ වෙතත්, 2015 සිට ආයුගණක තක්සේරුව සිදුකර නොතිබුණි. | එකහවන අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කර ගත් පසුව එය 2019 දී නිවැරදි කරනු ලැබේ. | සංගත ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

#### 1.5.3. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ණය ශේෂය ඇමරිකන් ඩොලර් 16,407,693 හා ගෙවිය යුතු පොලී ඇමරිකන් ඩොලර් 20,509.66 ක් | 2019 ජූලි 29 දිනැති විගණන ගැලපුම් සමඟින් අදාල නිරීක්ෂණය නිවැරදි කරන ලදී. | විදේශ විනිමය වලින් නම්කර ඇති වත්කම් හා වගකීම් නිවැරදි අනුපාත භාවිතා කරමින් |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීමේදී 2018 දෙසැම්බර් 31 දිනට මහබැංකු විකුණුම් අනුපාතය වන රු.184.6966 වෙනුවට මහබැංකු ගැනුම් අනුපාතය වන රු.180.72 භාවිතා කර තිබුණි. එම නිසා, 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය හා පොලී වියදම රු.65,328,390ක් අඩුවෙන් සටහන් වී ඇත. | | පරිවර්තනය කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (ii) ගණුදෙනුකරුවන්ගේ හඳුනා නොගත් තැන්පත් වටිනාකම වූ රු. 1,484,470 ක් 2018 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් වී තිබුණද ගිණුම්ගත කර නොතිබුණි. | බැංකු ගිණුම් සැසඳුම් කර හඳුනා නොගත් තැන්පත් නිරවුල් කිරීමට ශාඛා වලට දැනටමත් දැනුම්දී ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (iii) 2018 දෙසැම්බර් 31 දිනට කාර්යාලීය පාරිභෝගික භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය හා ප්‍රවර්ධන අයිතමයන්ගේ භෞතික සත්‍යාපන වාර්තා ශේෂය හා පොදු ලෙජර ශේෂය අතර රු.6,895,607 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස සැසඳුම් කිරීම සඳහා අවධානය යොමු කරන ලදී. | භෞතික සත්‍යාපන වාර්තා ශේෂය හා පොදු ලෙජර ශේෂය අතර වෙනස සැසඳුම් කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (iv) මූල්‍ය ප්‍රකාශන වල වාහන ලීසිං පොලී ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබුණි. | යෝග්‍ය පරිගණක පද්ධතියක් නොමැති වීම හේතුවෙන් ගණුදෙනු හස්තමය ආකාරයට කරන ලද අතර අනාගත ලීසිං ගණුදෙනු වලදී මෙය නිවැරදි කරනු ලැබේ. | ලීසිං පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගැනීමට අවශ්‍ය පියවර ගන්න. |
| (v) මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 18 ට අනුව පරිගණක මෘදුකාංග වල සමුච්චිත ක්ෂය වීම් ආසන්න වශයෙන් වර්ෂය ආරම්භක පිරිවැය වූ රු. 30,377,146 කට සමාන විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 19.2 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක මෘදුකාංග රු.1,066,448 ක් පමණක් වූ අතර | මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 19.2 හි සඳහන් පරිදි සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක දෘඩාංග රු.78,103,241 ක් වූ අතර මෙහි ඇතුලත් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක මෘදුකාංග රු.23,741,136 කි. කෙසේ වෙතත්, අප විසින් දක්වන ලද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | |
|---|---|---|
| මෙම සටහන් එකිනෙකට පරස්පර විරෝධී වේ. | පරිගණක මෘදුකාංග රු.1,066,448 කි. එමනිසා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක මෘදුකාංග රු. 24,807,584 ක් විය යුතුය. | |

### 1.5.4. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනට රු. 20,108,614 ක් වූ පාලන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. | අදාල ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට පසුව නිරවුල් කර ඇති අතර 2019 සැප්තැම්බර් 30 දිනට වාර්තා වූ ශේෂය රු.1,873,526 කි. | මෙම පාලන ගිණුම් ප්‍රමාදයකින් තොරව නිරවුල් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට රු.4,932,495ක බැර ශේෂය ක් හඳුනා නොගත් ගණුදෙනුකරුවන්ගේ තැන්පත් ගිණුමේ හඳුනා ගැනීමකින් තොරව පැවතුණි. | 2019 ජූලි 31 දිනට මෙම ශේෂය රු. 4,522,653 ක් දක්වා නිරවුල් කර ඇත. | මෙම පාලන ගිණුම් ප්‍රමාදයකින් තොරව නිරවුල් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

### 1.5.5. අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය හිමි අවිනිශ්චිත ගිණුම් හා ණය ගැති අවිනිශ්චිත ගිණුම් සඳහා වෙන්වූ ගිණුම් පවත්වා නොගෙන බැංකුව විසින් එකම ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. ඉහත අවිනිශ්චිත ගිණුමේ රු.13,598,183 ක බැර ශේෂයක් පැවති අතර 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල වෙනත් වත්කම් යටතේ වර්ගීකරණය කර තිබුණි. ඉහත සඳහන් බැර ශේෂය හේතු කොටගෙන වත්කම් හා වගකීම් රු.13,598,183 කින් අඩුවෙන් දක්වා තිබුණ බව නිරීක්ෂණය විය. | එස්එම්ර් බැංකුව සමඟ ඒකාබද්ධ කිරීම හේතුකොට ගෙන මෙම වැරද්ද පැන නැගී ඇති අතර එය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වත්කම් හා වගකීම් කමිටු රැස්වීම වෙත යොමු කිරීමට යෝජනා කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

### 1.5.6. අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයෙහි ආදායම් බදු | 2018 වර්ෂයේ අවසන් බදු ගෙවීමේදී මෙම තත්වය නිරවුල් | අදාල රෙගුලාසි වලට අනුකූලව බදු ගණනය කිරීම පිළියෙල |

| | | |
|---|---|---|
| වියදම ලෙස රු.69,692,025 ක් පෙන්නුම් කර තිබුණි. ඉහත අගය ගණනය කිරීම විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | කරනු ඇත. | කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (ii) රු. 4,772,824 කින් මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු වියදම වැඩියෙන් හා ලාභය අඩුවෙන් ගණනය වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගයමත බදු රු.4,346,948 කින් අධි ගණනය වී තිබුණි. | 2019 ජූලි 29 දිනැති විගණන ගැලපුම් සමඟින් අදාල නිරීක්ෂණය නිවැරදි කරන ලදී. | අදාල රෙගුලාසි වලට අනුකූලව බදු ගණනය කිරීම පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

### 1.5.7. බැංකුවේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 2.7.ii ට අනුව, බැංකුවේ අඛණ්ඩ පැවැත්ම දිගින් දිගටම පවත්වාගෙන යෑමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර තිබූ අතර ඉහත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට 2016 වර්ෂයේ රජයේ අයවැයෙන් යෝජනා වී තිබුණු අතර ඒ අනුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ කොටස් සියයට 100 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කරගෙන තිබුණු අතර මෙම කරුණ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | මෙය රජයේ තීරණයක් වන අතර බැංකුව වෙත විධිමත්ව දැනුම් දෙනු ලැබුයේ 2019 පෙබරවාරි 7 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසුවය. | 2018 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ අයිතිය මාරුවී තිබුණු අතර එම නිසා යෝග්‍ය අනාවරණය කිරීම් සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

### 1.5.8. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට, 2012 වර්ෂයේ සිට පැවත එන අයකර නොගත් රු. 1,432,019 ක් වූ | එස්එම්ඊ බැංකුව ඒකාබද්ධ කිරීම හේතුකොට ගෙන මෙම නිරීක්ෂණය ඇති වී ඇති අතර | ශේෂයක් ඇත්නම් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්න. |

| | |
|---|---|
| ශේෂයක් එස්එම්ඊ ණයගැති ගිණුමේ තිබුණි. තවද, සනාථ කිරීම සඳහා කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය. | එය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වත්කම් හා වගකීම් කමිටු රැස්වීම වෙත යොමු කිරීමට යෝජනා කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 227.8 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 298.2 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 70.4 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පොලී ආදායම අඩුවීම, මූල්‍ය වත්කම් මත හානිකරණ පාඩුව වර්ධනය වීම හා වෙනත් වියදම් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂය හා සසඳන විට පොලී ආදායම රු. මිලියන 85.8 කින් හෙවත් සියයට 10 කින් අඩුවී තිබුණි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණේ පෙර වර්ෂය හා සැසඳීමේදී ණය හා අත්තිකාරම් මත පොලී ආදායම රු. මිලියන 93.7කින් හෙවත් සියයට 32.9 කින් අඩුවීම වේ. 2017 වර්ෂය හා සැසඳීමේදී පොලී වියදම රු. මිලියන 12.3 කින් හෙවත් සියයට 16.6 කින් අඩුවී තිබුණි. 2017 වර්ෂය හා සැසඳීමේදී පාරිභෝගික තැන්පතු රු. මිලියන 77.7 කින් හෙවත් සියයට 19.3 කින් අඩු වීම ඉහත අඩුවීමට වීමට බලපා තිබුණි. විදේශ විනිමය ප්‍රත්‍යාගණන ප්‍රතිලාභය හේතුවෙන් පෙර වර්ෂය හා සැසඳීමේදී වෙනත් මෙහෙයුම් ආදායම් රු. මිලියන 130.6 කින් හෙවත් සියයට 730 කින් වර්ධනය වී තිබුණි.

### 2.3. අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයට අදාලව බැංකුවේ ඇතැම් වැදගත් ගිණුම්කරණ අනුපාත ආංශික අනුපාත සමඟ සසඳා පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවල සාමාන්‍ය ශුද්ධ පොලී ආන්තිකය හා සාමාන්‍ය ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 3.25 සියයට 3.82 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී බැංකුවේ එය පිළිවෙලින් සියයට 7.68 ක් හා සියයට 25.36 ක ඉහළ අගයක් වී තිබුණි.

(ii) බලපත්‍රලාභී විශේෂිත බැංකුවල සාමාන්‍ය අනුපාතය වූ සියයට 7.12 සැසඳීමේදී වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 4.23 ක අගයක් වාර්තා කර තිබුණි.

(iii) 2018 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය අනුපාතය සියයට 46.5 ක ඉහළ අගයක් නිරීක්ෂණය වූ අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකුවල සාමාන්‍ය අගය වූ සියයට 4.8 ට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(iv) 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 95.76 ක් වන අතර එය අවම අවශ්‍යතාවය වූ සියයට 11.875 ක ප්‍රමාණයට වඩා ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(v) 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ද්‍රවශීල වත්කම් අනුපාතය අවම අවශ්‍යතාවය වූ සියයට 20 ට සාපේක්ෂව සියයට 1,864.37 ක් දක්වා තවදුරටත් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 මාර්තු 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නාවල පරිශ්‍රයෙහි සිදුකරන ලද භෞතික සත්‍යාපනයට අනුව, | | පොදු ලෙජර ශේෂය සමඟ භෞතික ශේෂය සැසඳුම් කර සම්බන්ධිත පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්න. |
| අ) පිරිවැය රු. 6,304,959 ක් වූ හා ශුද්ධ පොත් අගය රු.788,043 ක් වූ තොග නොමැති බව නිරීක්ෂණය විය. | භෞතික තොග වෙනස සැසඳුම් කිරීම සඳහා විස්තරාත්මක සත්‍යාපනයන් පවත්වාගෙන යනු ලැබේ. | |
| ආ) පිරිවැය රු.779,689 ක් වූ 2015 දී හා 2017 වර්ෂ වලදී මිලදී ගත් ලැප්ටොප් තුනක්, අයිපෑඩ් එකක් හා අයිෆෝන් තුනක් හිටපු සභාපතිතුමා හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක විසින් නැවත භාරදී නොතිබුණි. | උපකරණ හිටපු සභාපතිතුමා හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක විසින් නැවත භාරදී නොතිබුණ අතර එම කාර්‍ය සඳහා විධිමත් ලෙස කටයුතු කරනු ලැබේ. | |

### 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂය තුලදී ප්‍රාග්ධන හා පොලී වාරික ලෙස ශ්‍රී ලංකා මහ බැංකු ගැනුම් විනිමය අනුපාතය භාවිතා කර රු.109,395,497 ක් ජීඕඑස්එල් ඇමරිකානු ඩොලර් ණය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙත ගෙවා තිබුණි. කෙසේ වුවත් ඉහත ණය වාරික ශ්‍රී ලංකා මහ බැංකු විකුණුම් අනුපාතය යටතේ පරිවර්තනය කළයුතු බැවින් 2018 වර්ෂයේදී ගෙවූ ණයවාරික රු.2,470,413ක් අඩුවෙන් ගෙවා තිබුණි. | ඉදිරි වියදම් වලදී මෙය සලකාබලනු ලබන අතර ඇමරිකානු ඩොලර් වත්කම් හා වගකීම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සාමාන්‍ය අනුපාතය යොදා ගැනීම ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්තිය වේ. | යෝග්‍ය අනුපාත යොදා ගනිමින් ජීඕඑස්එල් ඇමරිකානු ඩොලර් ණය පියවීමට අවශ්‍ය පියවර ගන්න. |

## 3.3. අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ගනුදෙණුකරුවන්ට ණය දීම් සිදුනොකර අවධානම් රහිත පොලී අනුපාත යටතේ බැංකුවේ මුදල් වලින් විශාල කොටසක් ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබුණි. මෙය බැංකුවේ මූලික අරමුණ වන කාර්මික, කෘෂිකාර්මික, වාණිජ, ඉදිකිරීම් හා වෙනත් ව්‍යවසායයන්ට අදාල උසස් කිරීම්, පිහිටුවීම්, පුළුල් කිරීම්, නවීකරණය කිරීම් හා සංවර්ධනය කිරීම් සඳහා ආධාර කිරීම යන්නට විරුද්ධ වේ. | බැංකුව විසින් එහි මූලික අරමුණ ළඟා කර ගැනීම සඳහා ණය ප්‍රදානය කරන අතර බැංකුවේ අක්‍රිය ණය පාලනය කිරීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම කරනු ලැබේ. | බැංකුවේ මූලික අරමුණ ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න. |
| (ii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරීවරුන් සමඟ මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 ඔක්තෝම්බර් 9 දින පැවති රැස්වීමේදී, ඇප අරමුදලක් ලෙස රජය විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වෙත රු. මිලියන 200 ක් ලබාදෙන ලදී. | | රැස්වීමේදී එකඟවූ පරිදි තීරණ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩාගාරයට ගෙවීමට ඇති වගකීම් පියවීමට අවශ්‍ය පියවර ගන්න. |
| අ) රැස්වීම් වාර්තා කොන්දේසි අංක 2 අනුව වර්ෂයට සියයට 7 ක අනුපාතයට රු.මිලියන 200 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආයෝජනය කළ යුතු විය. කෙසේ වෙතත්, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව විසින් රු.මිලියන 100 ක් පමණක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආයෝජනය කර තිබුණ අතර ඉතිරි රු.මිලියන 100 වෙනත් වාණිජ බැංකු වල ආයෝජනය කර තිබුණි. | ඇප අරමුදල් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ලිඛිත ගිවිසුමක් නොමැත. කෙසේ වෙතත් රැස්වීමේදී එකඟවූ පරිදි රු. මිලියන 100 ක් පමණක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණි. | |

| | | |
|---|---|---|
| ආ) තවද, වාර්ෂික පොලී ආදායමෙන් සියයට 50 ක් වාර්ෂිකව අරමුදලට එකතු කළ යුතුය. කෙසේ වෙතත්, 2016 න් පසුව වාර්ෂික පොලී ආදායම අරමුදලට මාරු කර නොතිබුණි. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කර ගත් පසුව නිවැරදි කරනු ලැබේ. | |
| ඇ) මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද සියළු ණය 2018 දී නැවත අය කර ගෙන තිබුණි. කෙසේ වුවත්, ඉහත අරමුදල ආපසු ගෙවීම හෝ චක්‍රීය අරමුදලක් ලෙස පවත්වාගෙන යාම පිළිබඳව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | එකඟ වේ. | |
| (iii) මහවැලි ණය යෝජනා ක්‍රමයේ අදියර III ක්‍රියාත්මක කරගෙන යාම සඳහා 2009 නොවැම්බර් 12 දින රු.මිලියන 50 ක් මහවැලි අධිකාරිය විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වෙත ලබා දී තිබුණි. ගිවිසුමේ වගන්ති අංක 2 ' ඒ' හා ' බී' අනුව, සියයට 4 ක වාර්ෂික පොලී අනුපාතයක් සහිතව ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව විසින් අවුරුදු එකක නිදහස් කාලයද ඇතුළුව වර්ෂ 5 ක් තුළදී වාර්ෂික වාරික හතරකින් ණය ගෙවිය යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් එම නියමයන් අනුගමනය කර නොතිබුණ අතර වර්ෂ 9 ට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ශේෂය ලෙස පවත්වාගෙන යනු ලැබේ. | 2018 දෙසැම්බර් 31 දිනට මුළු වගකීම් ලෙස රු. 68,196,761ක් බැංකුව විසින් ගිණුම්ගත කර තිබුණ අතර මහවැලි අධිකාරිය විසින් ඉහත ශේෂය තහවුරු කර තිබේ. තවද, මෙම අරමුදල බැංකුව විසින් ඉහළ අනුපාතවලට ආයෝජනය කර තිබේ. | ගෙවිය යුතු ශේෂ පියවා දැමීමෙන් පසුව ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රම වසා දැමීමට අවශ්‍ය පියවර ගන්න. |